# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

කේ.ජී.එන්.පී.එච්.එම්.ජේ.මොහොමඩ්,
අංක 07, ටෙලිකොම් පාර,
අකුරණ.
තැ.පෙ.20850

<u>අභියාචක</u>

**අභියාචනා අංකය : 697/2021**

**-එදිරිව-**

වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය,
පොළොන්නරුව.

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය නැත. දු:ක අංක 071 4410400 මගින් සම්බන්ධ වේ.
(තිස්ස දයාරත්න මහතා- තොරතුරු නිලධාරි)

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - 2021.11.16

**විභාග කළ දිනය** : 2022.03.16

**තීරණය කළ දිනය** : 2022.03.16

**<u>තීරණය :</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.12.07 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"2008 වර්ෂයේ සිදු කරන ලද ජයන්තිපුර ත්‍රිකොන්ඩියාවුමඩු වැසූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සහ පිබිදෙමු පොලොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැලසුමක් නොමැතිව සංවර්ධනය කිරීමේ හේතුවෙන්, ව්‍යාපාරික ස්ථානය සහ දේපළවලට සිදුවූ හා සිදුවෙමින් පවතින දැඩි හානිය සඳහා වන්දි මුදල් ලබා ගැනීම සහ වැසි ඇති අංක 71/2, 71/3, 71/4, 71/5,71/6, 71/7, 71/8 දරණ බෝක්කු සහ සම්බන්ධව වන ගොඩකර ඇති Out Let, Lead Way හා Drain ගැඹුරු කරය කොන්ක්‍රීට් කර යථා තත්ත්වයට පත්කර ගැනීම සම්බන්ධව 2020.08.09 වන දින වාරිමාර්ග අධ්‍යක්ෂ, පොලොන්නරුව වෙත ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් සියලු තොරතුරු ලබා දෙන ලෙස"*

තොරතුරු නිලධාරි පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2021.02.03 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි ද පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2021.04.10 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් අභියාචකටද පිටපත් සහිතව 2021.11.16 වන දිනැති ලිපියක් මගින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"02- ඒ අනුව ඔබගේ ලිපියෙහි අපේක්ෂිත තොරතුරු වාර්තාව පහත දක්වමි.*

*i. අංක 07, ටෙලිකොම් පාර, අකුරණ ලිපිනය සඳහන් කේ.ජී.එන්.පී.එච්.එම්.ජේ.මොහොමඩ් මහතා විසින් 2020/12/07 දිනැති ලිපිය මගින් තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන පරිදි තොරතුරු දැනගැනීමට ඉල්ලා ඇත.*

*ii. ඒ අනුව කේ.ජී.එන්.පී.එච්.එම්.ජේ.මොහොමඩ් මහතා වෙත ඔහු විසින් විස්තර ඉදිරිපත් කරන කරුණු වලට අදාළ පිළිතුරු ලබා දී ඇති හෙයින් එකම කාරණාවක් සම්බන්ධයෙන් නිරන්තර ලිපි ඉදිරිපත් කරන බැවින් ඔහුගේ ගැටලුවට අදාළ පිළිතුරු ලබාදීම සඳහා ඒ මහතාගේ අදාළ ඉඩමේ අයිතිය තහවුරු කිරීමේ ලිපිවල ඡායා පිටපත් ඉදිරිපත් කරන ලෙස කේ.ජී.එන්.පී.එච්.එම්.ජේ.මොහොමඩ් මහතා වෙත මගේ අංක DI/PLN/W1/General/2021 දරණ 2021.02.08 දිනැති ලිපියෙන් ඔහු වෙත දන්වා පිළිතුරු යවා ඇති බව කාරුණිකව ඔබ වෙත දන්වමි. එම ලිපියේ සහතික කළ පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමග එවමි.*

*iii. එසේ වුවද ඒ සඳහා ඔහු මේ දක්වා පිළිතුරු ඉදිරිපත්කර නොමැති බවද සඳහන්කර සිටිමි."*

**සලකා බැලීම**

මෙම පරික්ෂණයට සහභාගි වන අභියාචක, නව තොරතුරු ඉල්ලීමක් ඉහත සඳහන් පොදු අධිකාරිය වෙත සිදු කිරීමේ අයිතියට යටත්ව, මෙම අභියාචනය සහ මෙම අභියාචනයට පදනම් වූ තොරතුරු ඉල්ලීම මත පසු අවස්ථා වල සිදු කරන ලද සියලුම සිහි කැඳවීම් ඉල්ලා අස් කර ගැනීමට ඉල්ලීමක් කරයි.

අභියාචකගේ මෙම ඉල්ලීම සලකා බලා නව ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අයිතියට යටත්ව 2020.12.07 දිනැති තොරතුරු ඉල්ලීම මත පදනම් වූ මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට ඉඩ දීමට කොමිෂන් සභාව තීරණය කරයි. ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරී වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය නිෂ්ප්‍රභා කරන ලදී.